# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2300/24 - 2022 ඔක්තෝබර් මස 05 වැනි බදාදා - 2022.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, ම විසින් 2022 සැප්තැම්බර් මස 16 දිනැති අංක 2297/78 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මගින් සංශෝධිත, 2022 ජූලි මස 22 දිනැති අංක 2289/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය, 2022 ඔක්තෝබර් මස 06 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් වන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

1A - G 37695 — 366 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

(1) එම නිවේදනයෙහි "අංක 01. ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 16 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 17 සිට 28 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 16 සිට 27 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 19 අයිතමය ඉවත් කිරීමෙන්;

(ඈ) එහි II වැනි තීරුවෙහි අංක 20 සිට 28 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 19 සිට 27 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන්;

- මාධක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (2008 අංක 1)
- ඖෂධවලට අබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර කිරීම හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත (2007 අංක 54)
- ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල පනත (1984 අංක 11)

(2) එම නිවේදනයෙහි "අංක 03. තාක්ෂණ අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 11 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 12 සහ 13 අයිතමයන් පිළිවෙලින් අංක 11 සහ 12 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 1 සහ 5 අයිතමයන් ඉවත් කිරීමෙන්;

(ඈ) එහි II වැනි තීරුවෙහි අංක 2 සිට 4 දක්වා සහ අංක 6 අයිතමයන් පිළිවෙලින් අංක 1 සිට 4 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන්;

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32)
- විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනත (1994 අංක 11)

(3) එම නිවේදනයෙහි " අංක 06. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි:-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 7 අයිතමය ඉවත් කිරීමෙන්;

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 8 සිට 13 අයිතමයන් පිළිවෙලින් අංක 7 සිට 12 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 1 අයිතමය ඉවත් කිරීමෙන්;

(ඈ) එහි II වැනි තීරුවෙහි අංක 2 සිට 7 දක්වා අයිතමයන් පිළිවෙලින් අංක 1 සිට 6 දක්වා වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් අයිතමයන් ඉවත් කිරීමෙන්;

- ආගාමික හා විගාමික පනත (1948 අංක 20)
- පුරවැසි පනත (1948 අංක 18)
- ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)
- අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)
- අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)

(4) එම නිවේදනයෙහි "අංක 19. කර්මාන්ත අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි අංක 27 අයිතමයට පසු පහත සඳහන් අයිතමය ඇතුළත් කිරීමෙන්;

28. කාර්මික තාක්ෂණ ආයතනය

(ආ) එහි III වැනි තීරුවෙහි "ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත (1993 අංක 50)" අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

- විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත (1994 අංක 11)

(5) එම නිවේදනයෙහි "අංක 28. මහජන ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි අංක 9 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන්;

10. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කටයුතු
11. ආගමන හා විගමන කටයුතු
12. අන්තරාකාරී ඖෂධ භාවිතය වැළැක්වීම හා පාලනය

(ආ) එහි I වැනි තීරුවෙහි අංක 10 සහ 11 අයිතමයන් පිළිවෙලින් අංක 13 සහ 14 වශයෙන් නැවත අංක ගත කිරීමෙන්;

(ඇ) එහි II වැනි තීරුවෙහි අංක 3 අයිතමයට පසු පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන්;

4. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
5. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
6. අන්තරායකාර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

(ඈ) එහි III වැනි තීරුවෙහි "ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත (1980 අංක 31)" අයිතමයට පසුව පහත අයිතමය එකතු කිරීමෙන් ;

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32)
- ආගාමික හා විගාමික පනත (1948 අංක 20)
- පුරවැසි පනත (1948 අංක 18)
- ඉන්දීය සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (2003 අංක 35)
- අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත (1986 අංක 5)
- අදේශිකයින්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත (1988 අංක 39)
- මාධක ඖෂධ සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (2008 අංක 1)
- ඖෂධවලට අබ්බැහිවූ තැනැත්තන් (ප්‍රතිකාර කිරීම හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත (2007 අංක 54)
- ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩල පනත (1984 අංක 11)

EOG 10 - 0025

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.